# රට නැවත විවෘත කිරීමේ ක්‍රියාවලියේ දී කෝවිඩ් 19 වසංගත තත්ත්වයට සාර්ථකව ප්‍රතිචාර දක්වමින් මගීන් හා සේවක මණ්ඩල වල ආරක්ෂිතභාවය  තහවුරු කර වසංගතය පැතිරයාම වැළැක්වීම සඳහා පොදු ප්‍රවාහන සේවා ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳව වූ

## උපදෙස් මාලාව

ප්‍රවාහන අමාත්‍යාංශය

**2021 සැප්තැම්බර් 20**

## කෝවිඩ් වසංගත තත්ත්වය තුළ රට නැවත විවෘත කිරීමේදී පොදු ප්‍රවාහන සේවා ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳව වූ උපදෙස් මාලාව

### 1. පොදු උපදෙස්

මෙම උපදෙස් මාලාව ක්‍රියාත්මක කිරීම තුළින් ළඟා කර ගැනීමට බලාපොරොත්තු වන අරමුණු,

(අ). කෝවිඩ් 19 වසංගත තත්ත්වයට සාර්ථකව ප්‍රතිචාර දක්වමින් පොදු ප්‍රවාහන සේවා වල ගමන් කරන මගීන් හා සේවක මණ්ඩල වල ආරක්ෂිතභාවය තහවුරු කර වසංගතය පැතිරයාම ඉතා අවම කිරීම හෝ වැළැක්වීම.

(ආ). දීර්ඝ කාලීනව මගී ජනතාව පොදු ප්‍රවාහන සේවය සඳහා ආකර්ශණය කර ගැනීම (සැලකිය යුතු මගීන් පිරිසක් පොදු ප්‍රවාහන සේවා සහමුලින්ම අතහැර දමා ඇති අතර, දිනපතා පොදු ප්‍රවාහනය අතහරිමින් සිටින පිරිස වැඩිවීමක් පෙන්නුම් කෙරේ) හා පොදු ප්‍රවාහනයේ අනාගත අවිනිශ්චිතතාව නැති කිරීම සඳහා මගීන්ගේ විශ්වාසය නැවත දිනාගැනීම.

ඉහත අරමුණු ද්විත්වය ළඟා කරගැනීමේදී, පොදු ප්‍රවාහන සේවා සැපයුම් කරුවන් හා ආයතන විසින් පහත පරිදි ක්‍රියාත්මක විය යුතුවේ.

(අ). කොවිඩ් - 19 වසංගත තත්ත්වයෙන් ආරක්ෂාවීමට හා එය පැතිරීම පාලනයට අවශ්‍යය වන නිර්දේශ ක්‍රියාත්මක කිරීම පොදු ප්‍රවාහන සේවා සපයන ආයතනවල මූලික වගකීමක් වන බව සැලකිය යුතුය.

(ආ). අවශ්‍යතාවන් ප්‍රමුඛතා ගතකොට, මුලින්ම සිදුකල හැකි නිර්දේශ ක්‍රියාත්මක කොට, රට නැවත විවෘත කිරීමේදී පොදු ප්‍රවාහන සේවා ක්‍රමිකව ආරම්භ කොට පවත්වා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය.

## 2. ප්‍රවාහන අමාත්‍යංශයේ කාර්ය භාරය

**2.1.** සෞඛ්‍ය නිර්දේශ මත පදනම්ව, පොදු ප්‍රවාහන සේවා ආරම්භ කොට පවත්වා ගැනීමට අවශ්‍ය නිර්දේශ හා උපදෙස් සැකසීම හා යාවත්කාලින කිරීම.

**2.2.** කොවිඩ් - 19 වසංගත තත්ත්වය තුළ ප්‍රවාහන සේවා නිසි පරිදි පවත්වා ගන්නා බව තහවුරු කරගැනීමේ අරමුණින් අදාළ සියළු පාර්ශ්ශවයන් සහභාගිත්වයෙන් ක්‍රියාකාරී කමිටුවක් ස්ථාපිත කිරීම හා සම්බන්ධිකරණ රැස්වීම් පැවැත්වීම.

2.2.1. මහා භාණ්ඩාගාරය සමඟ සම්බන්ධීකරණය තුළින් වසංගත පාලනයට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමට කටයුතු කිරීම.

**2.4** කොවිඩ් වසංගත පාලනය පිළිබඳ ජාතික මෙහෙයුම් මධ්‍යස්ථානය හා සම්බන්ධ වෙමින් පොදු ප්‍රවාහන සේවා අවශ්‍යතා නිසි ලෙස හඳුනා ගැනීම. උදාහරණ ලෙස, නම්‍යශීලි කාර්යාල වේලාවන්, ප්‍රවාහන සේවා වැඩිකිරීමට අවශ්‍ය මාර්ග හා ප්‍රදේශ ලෙස අවශ්‍යතාවන් හඳුනාගැනීම.

## 3. බස් රථ ප්‍රවාහනය සඳහා මාර්ගෝපදේශ

### 3.1. ජාතික ගමනාගමන කොමිසමේ කාර්යභාරය

පළාත් මාර්ගස්ථ අධිකාරී හා ලංගම සමග ඒකාබද්ධව පහත මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම ජාතික ගමනාගමන කොමිසමේ වගකීම වේ.

i. මුඛ ආවරණ පැළඳීම, පුද්ගලයින් අතර නියමිත පරිදි දුරස්ථභාවය පවත්වා ගැනීම, කතා කිරීම මගින් රෝග පැතිරීයාම සිදුවන නිසා ඒ බව දන්වමින් මගීන් එකිනෙකා සමග කතා කිරීම නිසා ඇතිවිය හැකි අයහපත් ප්‍රතිඵල මගීන්ට අවබෝධ කොට දීම. බසය තුළ බුලත් සැපීම සහ කෙළ ගැසීම වැලැක්වීම, මගීන්ගේ විශ්වාසය ඉහල නැංවීම සඳහා කොන්දොස්තර හා රියදුරු මහතුන් එන්නත්කරණය ලබා ඇති බවට තහවුරු කර ගැනීම ඇතුළු සෞඛ්‍ය මාර්ගෝපදේශ හා නිර්දේශ ඇතුළත් ශ්‍රව්‍ය නිවේදන බස්රථ වල සහ නැවතුම්පළ වල ඇලවීම හා ස්ටිකර සකස් කිරීම / ඒ සඳහා පොදු උපදෙස් ලබාදීම.

ii. සියළුම බස් රථ සේවකයින්, සහායක කණ්ඩායම්, තාක්ෂණික කාර්යමණ්ඩලය ඇතුළු සහායක සේවා කණ්ඩායම් සඳහා එන්නත්කරණය සිදු කිරීම.

iii. මගීන් හා ප්‍රවාහන සේවා සපයන්නන් වෙත ලබා දීම සඳහා සිංහල හා දමිළ භාෂා මාධ්‍යයෙන් උපදෙස් මාලාව මුද්‍රණය කොට බෙදාහැරිම.

iv. අවශ්‍ය උපදෙස් අඩංගු කොට බස් රථ තුළ, බස් පර්යන්ත හා නැවතුම් වල ප්‍රදර්ශනය /ඇලවීම සඳහා ස්ටිකර මුද්‍රණය කොට බෙදාහැරීමට පියවර ගැනීම.

v. බස් රථ හා පර්යන්ත විෂබීජහරණය සිදුකරන බව වාර්තාකොට පෙන්වීම සඳහා අවශ්‍ය සරල කාඩ් පතක් මුද්‍රණය කොට ලබාදීම.

vi. අවශ්‍ය තත්ත්ව වාර්තාකරණය සඳහා බස් රථ රියදුරු හා කොන්දොස්තර වෙනුවෙන් සුහුරු, සරල කාඩ් පතක් ලබාදීම.

vii. බස් රථ කාලසටහන් වාර්තාකරු සඳහා ද වසංගත පාලන උපදෙස් ක්‍රියාත්මක කිරීම වාර්තාකරණය සඳහා සරල, සුහුරු කාඩ් පතක් ලබාදීම.

## 3.2. ජාතික ගමනාගමන කොමිසම, මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරි, ශ්‍රී ලංගම ඇතුළු පොදු බස්රථ ප්‍රවාහන මෙහෙයුම් ආයතන (Operators) සඳහා උපදෙස්

i. සේවයේ යෙදෙන සියළුම බස්රථ සේවකයින්, සහායක කණ්ඩායම්, ශ්‍රී ලංගමයේ තාක්ෂණික සේවාව ඇතුළු සහායක සේවා කණ්ඩායම් සඳහා එන්නත්කරණය සිදු කර ඇති බවට සහතික වීම.

ii. සියළුම බස් රථ සේවකයින්, සහායක කණ්ඩායම්, ශ්‍රී ලංගමයේ තාක්ෂණික සේවා ඇතුළු සහායක සේවා කණ්ඩායම් සේවයේ යෙදෙන අවස්ථාවේ නියමිත ප්‍රමිතියෙන් යුතු මුඛ ආවරණ පැළඳ සිටීම තහවුරු කිරීම.

iii. හැකි සෑම විටම බස්රථ නියමිත පරිදි විෂබීජහරණයකට ලක්කිරීම.

iv. හැකි සෑම විටම බස් නැවතුම්පොළ පරිශ්‍ර, කාර්යාල, වැඩපල, කාර්යමණ්ඩල විවේකාගර සහ වැසිකිළි යනාදිය විෂබීජහරණය කිරීම.

v. පොදු ප්‍රවාහනයේදී අනුගමනය කළ යුතු වත්පිළිවෙත් අන්තර්ගතකොට සකස් කරනු ලබන පොදු උපදෙස් මාලාවක් බස් නැවතුම්පල පවතින මහජන ඇමතුම් පද්ධතිය හරහා සිංහල හා දමිළ මාධ්‍යයෙන් වරින් වර ප්‍රචාරය කිරීම සහ බස් රථ තුළ ද එය ප්‍රචාරය කිරීම තහවුරු කිරීම.

vi. බස් රථ නියමිත කාලසටහන අනුව ගමන් ආරම්භ කිරීම හා අනවශ්‍ය ලෙස නැවතුම්පල වල නොරැඳෙමින් නියමිත වේලාවට ගමනාන්තය දක්වා ළඟාවීම සහතික කිරීම.

vii. දැනටමත් ලබාදී ඇති සෞඛ්‍ය උපදෙස්වලට අනුගතවෙමින් මගීන් බස් රථයට ඇතුළත් කර ගැනීම සහ බස් රථය තුළ මගීන් තදබදයකින් තොරව ගමන් කිරීම

සඳහා කාර්යමණ්ඩල වලට උපදෙස් ලබා දීම සහ අධීක්ෂණය. අවශ්‍ය විට යෙදවීමට අතිරේක බස් රථ ප්‍රමාණයක් සූදානම් කොට තබා ගැනීම.

viii. අවශ්‍ය පරිදි, උපදෙස් පත්‍රිකා හා ස්ටිකර බස්රථ වල හා බස් නැවතුම්පළ වල ප්‍රදර්ශනය කොට තැබීම/අලවා තැබීම.

ix. හැකි තරම් දුම්රිය බස්රථ ඒකාබද්ධ කාලසටහනකට යොමුවීම හරහා මගීන් අතරමග ගැවසීම අවම කිරීම හා ඔවුන්ගේ ගමන් පහසුව සැලසීම.

x. මහජන පැමිණිලි සඳහා ක්ෂණික දුරකථන අංකයක් දිනකට අඩුම තරමේ පැය 16ක් වත් විවෘතව පවත්වා ගැනීම හා සියලුම මහජන පැමිණිලි සඳහා ඉහල සැලකිල්ලකින් යුතුව අවධානය යොමුකරන බව දැන්වීම.

xi. මගීන්ට අවහිර නොවන අයුරින්, දුරගමන් සේවා බස්රථ අවශ්‍ය පරිදි විෂබීජහරණයට ලක්කරන බව සහතික කිරීමට පියවර ගැනීම.

xii. බස් නැවතුම් හා පර්යන්ත තුළ, මගී පෝලිම් හා අනෙකුත් නැවතී සිටින ස්ථාන අවම තරමින් මීටරයක පරතරයකින් යුතුව සලකුණු කොට දැක්වීම.

## 3.3. ලංගම හා පෞද්ගලික බස් හිමිකරුවන් සඳහා උපදෙස්

i. සෑම ගමන් වාරයකට පෙර හා පසු නිර්දේශිත විෂබීජානුහරණ දියරයක් යොදා ගෙන බස්රථ විෂබීජානුහරණයට ලක් කිරීම කෙරෙහි අවධානය යොමුකිරීම.

ii. සේවයට වර්තා කරනු ලබන සියළුම රියදුරු හා කොන්දොස්තර මහතුන් එන්නත්කරණයට ලක්වූවන් බවට සහතික වීම.

iii. සේවයට වර්තා කරනු ලබන සියළුම රියදුරු හා කොන්දොස්තර මහතුන් රෝගීන්ගේ ආශ්‍රිතයන් / නිරෝධායනය වන පවුල් වල හෝ ආශ්‍රිතයින් නොවන බවට තහවුරු කර ගැනීම.

iv. බස්රථ කාර්යමණ්ඩලය (රියදුරු සහ කොන්දොස්තර මහතුන්) නියමිත ප්‍රමිතියෙන් යුතු මුඛ ආවරණ පැලඳීම සහතික කිරීම.

v. හැකි සෑම අවස්ථාවකදීම පොදු ප්‍රවාහනයේදී අනුගමනය කළ යුතු වත් පිළිවෙත් අන්තර්ගතකොට සකස් කරනු ලබන පොදු උපදෙස් මාලාවක් බස් රථවල පවතින ශ්‍රව්‍ය උපකරණ පද්ධතිය හරහා වරින් වර ප්‍රචාරය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම හා ඒ සඳහා බස්රථ කාර්යමණ්ඩලයට උපදෙස් ලබා දීම.

vi. අවශ්‍ය පරිදි සකස් කරනු ලබන උපදෙස් පත්‍රිකා හා ස්ටිකර බස්රථ වල ප්‍රදර්ශනය කොට තැබීම/අලවා තැබීම.

vii. දෑත් නිතරම විෂබීජහරණය කර ගැනීම සඳහා කොන්දොස්තරවරුන් සඳහා විෂබීජ නාශක දියර ලබා දීම.

viii. මගීන්ගේ මුහුණ පෙදෙසට එක එල්ලේ සුළං ගලා ඒම වලක්වා, බස් රථය තුළ මනා වාතය සංසරණයක් තහවුරු කිරීමට අවශ්‍ය පියවර ගැනීම. මේ සඳහා පවතින වා කවුළු නිසිපරිදි විවෘත කොට තබා ගැනීම.

## 3.4. බස් රථ කාර්ය මණ්ඩලය (රියදුරු සහ කොන්දොස්තර මහතුන්) සඳහා උපදෙස්

i. සියළුම මගීන් හා බස්රථ සේවක මහතුන් මුඛ ආවරණ පැළඳ සිටීම.

ii. දොර දෙකේ බස්රථ සඳහා මගීන් නංවා ගැනීම පසුපස දොරින්ද, මගීන් බැස්සවීම ඉදිරිපස දොරින්ද සිදුකල යුතුය.

iii. රියැදුරු අසුන ඉටිකොළ වලින් අවාරණය කර තිබියයුතුය.

iv. බස්රථය තුල වෙලදාම් කටයුතු හා යාචක කටයුතු සිදුකිරීම සපුරා තහනම් වේ.

v. ඊළඟ ගමන්වාරය තෙක් බස් රථය නවතා තැබීමේදී පිටස්තර පුද්ගලයින් බස්රථය තුලට ගොඩවැදීම වැළක්විය යුතුය.

vi. වැසි රහිත කාලවලදී වායු සමීකරණ රහිත බස් සඳහා ධාවනයේදී ජනෙල් සම්පූර්ණයෙන් විවෘතව තබාගැනීමට කටයුතු කිරීම.

vii. වායු සමිකරණය සහිතව ගමන් කරන බස්රථ වල බාහිර පරිසරය සමඟින් රථය  තුළ ඇති වාතය හුවමාරුවන ලෙසට වායු සමීකරණ පද්ධතිය සැකසීම. මෙසේ කිරීම ගමනාගමනය සිදුවන කාලය තුළ පමණක් විය යුතුය.

viii. මගීන් නිතර ස්පර්ශ වන ස්ථාන හැකි සෑම විටම විෂබීජානුහරන දියර ඉසීම මගින් විෂබීජානුහරණය කිරීම.

ix. පොදු ප්‍රවාහනයේදී අනුගමනය කළ යුතු වත් පිළිවෙත් අන්තර්ගතකොට සකස් කරනු ලබන පොදු උපදෙස් මාලාවක් බස් රථවල පවතින ශ්‍රව්‍ය උපකරණ පද්ධතිය හරහා වරින් වර ප්‍රචාරය කිරීම.

x. බස්රථයේ රේඩියෝ / ශ්‍රව්‍ය උපකරණ මගින් අධික ශබ්දයෙන් ගීත ආදිය ප්‍රචාරයෙන් වැලකීම. ඒ තුළින් මගීන් වඩා උස් හඬින් කතා කිරීමට පෙළඹෙන අතර එය රෝගය ව්‍යාප්තිය වැඩිවීමට හේතු විය හැක.

xi. බස්රථ නියමිත කාලසටහන අනුව ගමන් කිරීම සහ අනවශ්‍ය ලෙස අතරමග නැවතුම් පල වල නවත්වා සිටීමෙන් වැලකීම.

xii. දෙන ලද සෞඛ්‍ය උපදෙස්වලට අනුගත වෙමින් මගීන් බස් රථයට ඇතුළත් කර ගැනීම සහ බස් රථය තුළ මගීන් තදබදයකින් තොරව ගමන් කරන බවට වගබලා ගැනීම.

xiii. මගීන්ට අවහිර නොවන සේ, දුර ගමන් සේවා බස් රථ පැය 3 කට වරක් විෂබීජ හරණයට ලක්කිරීම.

xiv. බස් රථ අතරමග තේ පානය සඳහා නවත්වන්නේ නම් සෞඛ්‍ය උපදෙස් අනුව පවත්වා ගෙන යනු ලබන අවන්හල්වල පමණක් එසේ නැවැත්වීම සිදුකල යුතුය.

## 3.5. මගීන් සඳහා මාර්ගෝපදේශ

i. බස්රථය තුළ ගමන් කරන විට බුලත් සැපීම හා ආහාර ගැනීමෙන් වැලකීම.

ii. කිවිසුම් යාමේදී හා කැස්ස ඇතිවිට සෞඛ්‍ය උපදෙස් අනුව කටයුතු කිරීම.

iii. බස්රථ රියදුරු, කොන්දොස්තර මහතා හෝ වෙනත් මගීන් විසින් මාර්ගෝපදේශ කඩකරන්නේ නම් ක්ෂණික දුරකථන අංකය ඔස්සේ බලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කිරීම.

iv. බසයට නැගීමට පෙර, ටිකට් පත ලබාගත් පසු හා බසයෙන් බැස ගිය විගස ම යන අවස්ථා තුනේදීම දෙඅත් සනීපාරක්ෂක දියර යොදා පිරිසිදු කර ගැනීම.

v. බසය සම්පූර්ණයෙන්ම නැවතූ විට පමණක් බසයට නැගීම හා බැසීම කලයුතුය. බසය එසේ නවත්වන්නේ නැතිනම්

අදාළ අංශ වෙත ක්ෂණික දුරකථන අංකය ඔස්සේ වහාම දැනුවත් කිරීම.

vi. හැකි තරම් මතුපිට පෘෂ්ඨ හා අනෙකුත් මගීන් ස්පර්ශ නොවන ලෙස ගමන් කිරීමට වගා බලා ගැනීම.

vii. හැකි සෑමවිටම ගමනට අදාළ ප්‍රවේශ පත්‍රයේ වටිනාකමට සමාන මුදලක් ලග තබාගැනීමෙන් මුදල් හුවමාරුව අවම කිරීම.

## 4. දුම්රිය ගමනාගමනය සඳහා මාර්ගෝපදේශ මාලාව

i. සියළුම කාර්ය මණ්ඩලය, එනම් රියැදුරන්, නියාමකවරුන්, ආරක්ෂක අංශ නිලධාරීන්, දුම්රිය ස්ථාන කාර්ය මණ්ඩලය ඇතුළු සියළුම දෙනා එන්නත්කරණයට ලක්කිරීමට කටයුතු යෙදීම.

ii. කාර්ය මණ්ඩලය, එනම් රියදුරන්, නියාමකවරුන්, ආරක්ෂක අංශ නිලධාරීන්, දුම්රිය ස්ථාන සේවකයින් ඇතුළු සියළුම දෙනා රාජකාරියේදී මුඛ ආවරණ පැළදීම.

iii. ගමන් වාරයට පෙර හා පසු දුම්රිය මැදිරි විෂබීජහරණයට ලක් කිරීම.

iv. දුම්රියපල පරිශ්‍ර, වැඩපලවල් සහ කාර්යාල දිනපතා විෂබීජානුහරණයට පත් කිරීම. නිතර මගීන් ස්පර්ශ කරනු ලබන ස්ථාන (ප්‍රවේශ පත්‍ර කවුළු වැනි) දිනකට කිහිප වාරයක් විෂබීජානුහරණය කිරීම.

v. දුම්රියපල වලට ඇතුළු වන ස්ථාන වල උෂ්නත්වය මැනීමේ ක්‍රමවේද තවදුරටත් ක්‍රියාත්මක කිරීම.

vi. සියළුම මගීන් මුඛ ආවරණ පැළඳ සිටින බවට තහවුරු කර ගැනීම.

vii. නිතර ස්පර්ශ වන ස්ථාන හා පෘෂ්ඨ විෂබීජනාශක වලින් වරින් වර පිස දැමීමට පියවර ගැනීම හා ඒ සඳහා දුම්රිය කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම.

viii. දුම්රිය ස්ථාන හා දුම්රිය තුළ පවතින සංනිවේදන උපකරණ මාර්ගයෙන් අදාළ මාර්ගෝපදේශ පිළිබඳව මගීන් දැනුවත් කිරීම.

ix. දුම්රියට ගොඩවීමේදී හා බැසීමේදී ඇති වන තදබදය වලක්වා ලීමට නැවතුම් වලදී ඒ සඳහා ප්‍රමාණවත් කාලයක් ලබා දීම.

x. නියමිත කාලසටහන අනුව දුම්රිය ධාවනය කිරීම.

xi. දුම්රිය ස්ථාන වල මගී පෝලිම් හා අනෙකුත් ගැවසෙන ස්ථාන අවම කරමින් මීටරයක් පරතර සහිතව සලකුණු කර දැක්වීම.

**5.** මෙම මාර්ගෝපදේශ වලට අමතරව සෞඛ්‍ය අමාත්‍යාංශය හා අදාළ අංශ විසින් දැනටමත් නිකුත් කර ඇති මාර්ගෝපදේශ මෙන්ම ඉදිරියේදී වරින් වර නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ වලට ද අනුගත වීමට වග බලා ගත යුතුය.

**6.** මෙම උපදෙස්මාලාව සෞඛ්‍ය අමාත්‍යාංශයේ එකඟතාව ඇතිව නිකුත් කරන ලදී.